# මලී සහ නදී



ශනුලි ඉමායා රිශින්දි ගුණතුංග
2 ශ්‍රේණිය E

# මලී සහ නදී



කතෘ :- ශනුලි ඉමායා රිශින්දි ගුණතුංග

ශ්‍රේණිය :- 2-E

කතෘගේ වෙනත් කෘති : ආදර බිංගෝ

ISBN - 978-624-206-890-9

2023-10-28

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023. 10.20

# පිදුම

මෙම පොත් පිංච ලිවීම
සඳහා මා හට මඟ පෙන්වූ
මාගේ ආදරණීය
දෙමාපියන්ටත්
මාගේ පන්තිභාර
ගුරුතුමිය වන
චාමිනී පල්ලියගුරු
ගුරු මෑණියන්ටත්
සෙනෙහසින් පුදමි.

නදී සහ මලී කියන්නේ

එකම ගමේ ඉන්න

හොඳම යාළුවෝ දෙන්නෙක්.

මේ දෙන්නා හරිම සමගියි.

ඉගෙන ගන්නත් හරිම ආසයි.

ඉස්කෝලේ වැඩ

හොඳට කරන නිසා

මලීටයි, නදීටයි

ගුරුවරුත් ගොඩක් ආදරෙයි.

මල්ලියි, නදියි ඉස්කෝලේ
ගිහිං ඇවිත් හවස් වරුවේ
එකට සෙල්ලම් කරනවා.
මේ දෙන්නා එයාලගේ
ගෙට පහළින් තියෙන
ලස්සන වෙල් යායට තමයි
හැමදාම සෙල්ලම්
කරන්න යන්නේ...
ඒ වෙල්යාය
හරිම ලස්සසනයි

කොළඹ කොළපාට

වෙල්යාය අයිනෙන් ලස්සන

ඇළක් ගලාගෙන යනවා.

ඒ ඇළේ වතුර හරිම පිරිසිදුයි.

හැමදාම හවසට ලස්සන

කුරුළු රෑනක් වෙල්යාය

උඩින් පියඹාගෙන යනවා.

මලී සහ නදී හැමදාම

කුරුළු යාළුවන් එනකල්

බලාගෙන ඉන්නවා..

ඒ අතර මලිති බට්ටිලාගේ
කිචි බිචි ශබ්දෙත්
හතර වටෙන් ඇහෙනවා...
ඉර මාමත් වෙල් යාය
රන්වන් පාට කරමින්
එයාගේ ගෙදරට යන්න
ලෑස්ති වෙනවා...
ඒකනම් හරිම ලස්සන
පරිසරයක්...



කුරුළු රංචුව එනකල්

බලාගෙන හිටපු

මල්ලියි, නඳියි එකපාරටම

දැක්කා වෙල් යායට

උඩින් තියෙන ගුරු පාරෙන්

අශ්ව කරත්තයක් යනවා...

ඒ විතරක් නෙවෙයි

අශ්ව කරත්තෙන් ලස්සන

කුමාරිකාවක් යනවා

මේ දෙන්නා දැක්කා...

අශ්ව කරත්තේ ගමන් කරන

කුමාරිකාව බලාගන්න

ඕන නිසා අපි

අශ්ව කරත්තේ පසුපස

දුවමුද? මලී ඇහුවා...

ඒක හොඳ අදහස

දුවමු දුවමු කියලා කථා වෙලා

යාළුවෝ දෙන්නා

අශ්ව කරත්තය පිටුපස

දුවන්න ගත්තා...



අශ්ව කරත්තය යන

වේගයෙන් දුවන්න

බැරි බව දැන දැනත්

මේ දෙන්නා දුවන එකනම්

නතර කළේ නැහැ.

දුවගෙන යද්දි මලී එකපාරටම

මඩ වලකට වැටුණා.

එතන තිබුණ ගලක

ඔළුව වැදිලා

ලේ ගලන්න ගත්තා...

නදී බය වෙලා කෑ ගැහුවා.

අනේ අපිට උදව් කරන්න

කවුරුත් නැතිදෝ කියලා

නදී කෑ ගහපු සද්දේ

ඇහිලා මාමා කෙනෙක්

එතැනට ආවා...

ඒ මාමා මලී උස්සාගෙන

ඉක්මනින් වෙද මාමා ළඟට

අරගෙන ගියා...

වෙද මාමා තුවාලයට

බෙහෙත් දැම්මා...



මලීගෙ මඩ ගෑවුණ

ගවුම දැකපු වෙද මාමා

වෙද මාමලාගේ ගෙදර හිටපු

පුංචි අක්කා කෙනෙකුගේ

මල් මල් ගවුමකුත් මලීට

ඇඳගන්න දුන්නා...



පසුව වෙද මාමා

දෙන්නගෙන්ම මොකද වුණේ

කියලා ඇහුවා... යාළුවෝ දෙන්නා

වෙද මාමාට කථාව කිව්වා...

යාළුවෝ දෙන්නගේ කථාව

අහපු වෙද මාමා තමන්ට

බැරි දේවල් කරන්න ගියාම

අනතුරු සිද්ද වෙන බව

යාළුවෝ දෙන්නට කියලා දුන්නා...

නිමි...



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20

**ISBN - 978-624-206-890-9**